# කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ඇබෑර්තු

**1. නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (පිරිසැකසුම් තාක්ෂණ) (තනතුරු 01යි)**

**2. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති)- (තනතුරු 01 යි)**

## තලවකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ඉහත තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ

**රැකියා විස්තරය**

**01. නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (පිරිසැකසුම් තාක්ෂණ)**

තේ සැකසුම් තාක්ෂණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් විධිමත්ව සැකසීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් වගවීම.

**02. නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති)**

තේ තාක්ෂණ ව්‍යාප්තිය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් විධිමත්ව සැකසීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සම්බන්ධයෙන් වගවීම.

**නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ (පිරිසැකසුම් තාක්ෂණ) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) සඳහා සුදුසුකම් හා පළපුරුද්ද.**

**බාහිර**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව/ කෘෂිකර්මාන්තය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු හෝ දෙවන පංතියේ ඉහළ පෙළ (Upper Class) සහිතව සිව් (04) වසරක විශේෂ උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (Phd) උපාධිය.

**සහ**

පිළිගත් ආයතනයක, පර්යේෂණ හෝ ව්‍යාප්ති පිළිබඳ කළමනාකරණ මට්ටමේ අඩු තරමින් වසර දහසයක (16) පළපුරුද්ද. ඉන් වසර අටක් (08) (Phd) උපාධිය ලබා ගැනීමෙන් පසුව හා වසර දෙකක් (02) සේවා වාර්තා සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**සහ**

බහු ශික්ෂණ පර්යේෂණ විද්‍යාඥයින්, වෘත්තිකයින් හා ව්‍යාප්තිකාරක කණ්ඩායම් පෙළගැස්මේ හා මෙහෙයවීමේ සාධිත හැකියාවන් සහිත විය යුතුය. මානව හා අනෙකුත් සම්පත් ඵලදායී ලෙස මෙහෙයවීම හා කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව/ කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දෙවන පංතියේ ඉහළ පෙළ (Upper Class) සහිතව සිව් (04) වසරක විශේෂ උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය / (Phd) උපාධිය

**හෝ**

විද්‍යාව/ කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සමග වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (Phd) උපාධිය සහ අංශ ප්‍රධානී ප්‍රධාන පර්යේෂණ නිලධාරී/ ප්‍රධාන උපදේශක නිලධාරී ලෙස වසර හතරක (04) සතුටුදායක සේවා පළපුරුද්ද.

**සහ**

බහු ශික්ෂණ පර්යේෂණ විද්‍යාඥයින්, වෘත්තිකයින් හා ව්‍යාප්තිකාරක කණ්ඩායම් පෙළ ගැස්වීමේ හා මෙහෙයවීමේ සාධිත හැකියාවන් සහිත විය යුතුය. මානව හා අනෙකුත් සම්පත් ඵලදායී ලෙස මෙහෙවීම හා කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වේ.

| | | |
|---|---|---|
| **වැටුප් පරිමාණය** | : | HM 1-3 (2016) රු. 86,865 – 15X2,270 – රු. 120,915 – මාසිකව |
| **වයස** | : | අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ. |
| **තෝරා ගැනීමේ ක්‍රමවේදය** | : | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි. |

**වෙනත් ප්‍රතිලාභ :**

i. නවාතැන් (සම්පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාසය) තිබේ නම් සපයනු ලැබේ. නැතහොත් නවාතැන් වෙනුවට දීමනාවක් ගෙවනු ලැබේ.

ii. ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයේ පවත්නා රීතීන්ට අනුකූලව වෛද්‍ය ප්‍රතිලාභ ලබාදෙනු ලැබේ.

iii. සේවක අර්ථසාධක අරමුදල : තෝරාගනු ලබන අයදුම්කරු වැටුපෙන් 10% කින් සේවක අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, ආයතනය 15% කින් දායක වනු ඇත. සේවක භාරකාර අරමුදලට සමාගම 3% කින්ද දායකවනු ඇත.

iv. තේ පර්යේෂණ ආයතනයේ තනතුරට අදාළ ගෘහස්ථ සේවක ඒකක සහ වෙනත් අමතර ප්‍රතිලාභ අදාළ වේ.

තනතුර ස්ථිරය. තම සම්පූර්ණ ජීවදත්ත සඳහන් අයදුම්පත් උප්පැන්න සහතිකයේ, අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහතික, විද්‍යාත්මක සඟරාවල පළවූ ප්‍රකාශනවල පිටපත් හා නවෝත්පාදක නිපුණතා, කළමනාකරණ හා පරිපාලනමය දක්ෂතාවලට අදාළ සාධක සහ අදාළ ක්ෂේත්‍රයේ අයදුම්කරුගේ නිපුණතා හා දැනුම තක්සේරු කළ හැකි ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ඉදිරිපත් කළ යුතුය.

රාජ්‍ය සේවයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය හා අනුගත නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

කරුණාකර ඉල්ලා ඇති තොරතුරු, තේ පර්යේෂණ ආයතනයේ www.tri.lk වෙබ් අඩවියට පිවිස ගූගල් ආකෘතියේ උඩුගත කරන්න. ඉක්බිති සම්පූර්ණ කළ අයදුම්පත් ආධාරක ලිපිලේඛන හා සමග 2024 ජූනි 18 දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත තැපැල්/ කුරියර් සේවා මගින් ලැබෙන්නට සලස්වන්න. අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවකැලේ.**